**ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - 2015**

**---------------------------------------------------------**

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සමාලෝචිත වර්ෂය සඳහා වූ විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ / විදුහල්පතිවරයා වෙත 2016 දෙසැම්බර් 14 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000 – 1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 ආයතනය සංස්ථාගත කිරීම

------------------------------

2005 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/ 0994 / 029 / 013 ට අනුව ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය විධිමත් ලෙස සංස්ථාගත කරන තෙක් මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ

අනන්‍යතාවය මත තවදුරටත් පවත්වාගෙන යාමට ඉඩදිය යුතු යැයි තීරණය කර තිබුණි. එම තීරණය ලබාදී වර්ෂ 11 ක් ඉක්ම ගොස් තිබියදීත් ආයතනය සංස්ථාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

----------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

-------------------------------------------

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන වටිනාකම රු.92,376,914 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් උපකරණ සඳහා ගෙවීම් කිරීමේදී රඳවාගන්නා ලද රු. 288,741 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී උපදේශන දීමනා සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් ලබාදුන් මුදලින් වියදම් නොවී ඉතිරි වූ රු.134,955 ක මුදල ආපසු යැවිය යුතු නමුත් එය ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම මුදල නැවත අමාත්‍යාංශය වෙත යවා ඇතත් වැරදි ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම මුදල අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට දේශීය මිලදීගැනීම් අත්තිකාරම් ලෙස රු. 125,346 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද විගණනය වෙත සපයා තිබුණු තොරතුරු අනුව සත්‍ය වශයෙන්

අයවිය යුතුව ඇති මුදල රු. 32,500 ක් වූයෙන් එම ශේෂය රු. 92,846 කින් වැඩිපුර දක්වා තිබුණි.

2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්
---------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට උත්සව සහ විශේෂ ණය අත්තිකාරම් ලේඛන අනුව ශේෂය හා ලෙජර් ගිණුම් අනුව ශේෂය අතර රු. 177,900 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 6,383,077 ක් වූ සංචලනය නොවන වාහන අමතර කොටස් තොගය, තොග උපලේඛන අනුව රු. 6,644,588 ක් වූයෙන් රු. 261,511 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.350,000 ක් වටිනා ලිපිද්‍රව්‍ය හා පින්තාරු තොගය සම්බන්ධයෙන් තොග ලේඛණ හා තොග සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.

2.3 ලැබිය යුතු ගිණුම්
---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති ණයගැති ශේෂය වූ රු. 4,746,794 කින් රු. 4,164,543 ක් වර්ෂයකට වැඩි කාලපරිච්ඡේදයක සිට පැවත එන ශේෂයන්ගෙන් නියෝජනය විය.

(ආ) සේවයෙන් ඉල්ලා අස්වූ කනිෂ්ඨ උපදේශකවරයකුගෙන් අයවිය යුතු රු. 182,749 ක් 2016 සැප්තැම්බර් 15 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.
------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 756 හා 772 | 2015 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ සිදුකර අදාල වාර්තා 2017 පෙබරවාරි **28** දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණ අතර රු.433,781,879 ක් වටිනාකමැති යන්ත්‍ර හා උපකරණ මේ අතර විය. ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව පාවිච්චි කල නොහැකි භාණ්ඩ |

| | |
|---|---|
| | සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 9.3.1 – (VI) (VII) ඡේද | වැඩ බැලීමේ පත්වීමක් අවිනිශ්චිත කාල පරිච්ඡේදයකට අදාලව ලබානොදිය යුතු අතර විශේෂ හේතුවක් මත එසේ ලබාදී ඇත්නම් එම කාලය මාස 03 ක් නොඉක්මවිය යුතුය. එහෙත් ආයතනයේ නියෝජ්‍ය විදුහල්පති තනතුර සඳහා පත් කල නිලධාරියා 2012 සැප්තැම්බර් 18 දින සිට වර්ෂ 01 මාස 09 ක කාල පරිච්ඡේදයක් දක්වා වැඩ බැලීම සඳහා පත්කර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 48,910,721 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.41,711,984 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 7,198,737 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රජයේ පුනරාවර්තන ප්‍රදාන සහ විලම්භිත ආදායම් පිළිවෙලින් රු. 37,512,000 කින් හා රු. 37,992,296 කින් වැඩිවී තිබුණද වියදම් රු. 81,742,334 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය වන ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය වූ අතර 2011 වර්ෂයේදී එය රු.12,819,997 ක්වූ අතර සමාලෝචිත වර්ෂය වන විට රු.48,910,721 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකීමේදී 2011 වර්ෂයේදී රු.128,112,639 ක්වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.246,014,148 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

4.1 කාර්ය සාධනය
-----------------

ශ්‍රී ලංකාවේ මෝටර් රථ ඉංජිනේරු විද්‍යාව හා ඒ ආශ්‍රිත වෙළඳ ක්ෂේත්‍රය සඳහා වන තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීම ප්‍රධාන අරමුණ ඇතිව පිහිටුවා තිබුණු ලංකා ජර්මන් කාර්මික පුහුණු ආයතනයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දින වන විට ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය විසින් සිසුන් 1736 ක් සහභාගීවන පාඨමාලා 11 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර ඉන් සිසුන් 272 ක් සහභාගීවන පාඨමාලා 04 ක් ප්‍රතීතනය කර නොතිබුණි. ගාස්තු අයකිරීම මත සිසුන් 3500 ක් සහභාගී කර කෙටි කාලීන පාඨමාලා 35 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර මෙම පාඨමාලා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කර හෝ ප්‍රතීතනය කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් පවතින වාර්ෂික ඉල්ලුමට සරිලන පරිදි පුහුණු ධාරිතාවය පුළුල් කර නොතිබුණු බැවින් 2012 වර්ෂයේ සිට 2015 දක්වා වර්ෂ 04 ක කාල පරිච්ඡේදය තුළ සිසුන් 7699 ක් පාඨමාලා හැදෑරීම සඳහා ඉල්ලුම් කර තිබුණද පුහුණු අවස්ථා ලැබී තිබුණේ සිසුන් 1966 කට එනම් සියයට 26 කට පමණි.

(ඇ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනෙහි ආධාර යටතේ ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට අනුබද්ධව ආරම්භ කරන ලද විශ්ව විද්‍යාල විද්‍යායතනයේ 2015 දෙසැම්බර් 31 දින වන විට ඩිප්ලෝමා පාඨමාලා 04 ක් ආරම්භ කර සිසුන් 160 ක් බඳවාගැනීමට සැලසුම් කර තිබුණද පාඨමාලා 03 ක් පමණක් ආරම්භ කර සිසුන් 47 ක් පමණක් බඳවාගෙන තිබුණි. පවතින ක්‍රමවේදය අනුව මෙම පාඨමාලා සඳහා අයදුම් කිරීමට ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ ප්‍රායෝගික පුහුණුව ඇතුළත් වර්ෂ 05 ක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 4) මට්ටමේ පූර්ණකාලීන පාඨමාලාව අවසන් කළ යුතුව තිබුණි. උක්ත ඩිප්ලෝමා පාඨමාලා ද වර්ෂ 02 ක පූර්ණ කාලීන පාඨමාලා බැවින් ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කිරීමට එක් සිසුවකු හට වර්ෂ 07 ක කාලපරිච්ඡේදයක් ගත වනු ඇත. එබැවින් පාඨමාලා සඳහා ඉල්ලුම අඩුවීමට මෙම තත්ත්වය සෘජු ලෙස බලපා තිබුණි.

(ඈ) ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහා සියළුම සේවාදායකයින්ගේ දක්ෂතා දැනුම නිපුණත්වය හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණු ඇතිව මානව සම්පත් සංවර්ධන හා පුහුණු ප්‍රතිපත්තිය ස්ථාපනය කර ඇතත්, ආයතනයේ සමස්ථ කාර්ය මණ්ඩලයේ සියයට 25 කට පමණක් පුහුණු අවස්ථා ලැබීම හේතුවෙන් එම අරමුණ ඉටුකර ගැනීමට හැකිවන පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) ආයතනය විසින් 2012 – 2016 කාලපරිච්ඡේදය සඳහා සකස් කර තිබුණු සංයුක්ත සැලැස්මට අනුව ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට බාධාකාරී සාධක ලෙස හඳුනාගෙන තිබුණු ප්‍රමාණවත් පුස්තකාල පහසුකම් නොමැතිවීම, දත්ත මූලාශ්‍රයක් හා තත්ත්ව කළමනාකරණ පද්ධතියක් නොමැතිවීම හා ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපනය නොකිරීම යන අඩුපාඩු නිවැරදි කිරීමට සැලසුම්ගත කාලය ඉක්මවා තිබියදීත් ආයතනයට නොහැකි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ නව පනත සකස් කිරීමේදී, පාඨමාලාවලට සහභාගීවන අභ්‍යාසලාභීන් සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් පවත්වාගෙන යාමට විධිවිධාන ඇතුලත් කල යුතු බව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PF/FD/04/1998 Vol-1 හා 2013 මැයි 28 දිනැති ලිපියෙන් විදුහල්පති වෙත දන්වා ඇතත් කෙටුම්පත් පනතේ ඒ පිළිබඳ ප්‍රතිපාදන ඇතුලත් කර නොතිබුණි. කෙසේ වෙතත් විධිමත් අනුමැතියකින් තොරව 1999 වර්ෂයේ සිට රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා පාඨමාලා සඳහා සහභාගි වන එක් අභ්‍යාසලාභියෙකුගෙන් රු.275 ක් බැගින් අයකර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පාඨමාලා ප්‍රතීතනය කර නොතිබුණු බැවින් ඩිප්ලෝමා පාඨමාලා හදාරන සිසුන්ගේ ප්‍රථම අධ්‍යයන කාලය නිමවී ඇතත් අදාල විභාග පැවැත්වීමට තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදී නොතිබුණි. එබැවින් සිසුන් අදාල විභාගවලට ඉදිරිපත් කිරීමෙන් තොරව ක්ෂේත්‍ර පුහුණුව සඳහා යොමුකර තිබුණි.

(ඇ) ආයතනයේ නියෝජ්‍ය විදුහල්පති තනතුර සඳහා 2014 ජුනි 30 දින සිට 2016 අගෝස්තු 30 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ විධිමත් පත්වීමකින් හා අනුමැතියකින් තොරව වැඩ බැලීම් සිදුකළ නිලධාරියා වෙත රු. 512,839 ක් ගෙවීම් කර තිබුණි.

(ඈ) ආයතනයේ පිරිස් කළමනාකරු ලෙස සේවය කළ නිලධාරියා 2014 පෙබරවාරි 04 දින සිට ඉල්ලා අස්වී පෞද්ගලික ආයතනයක සේවය කර තිබුණි. ආයතන සංග්‍රහයේ **v** වන පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති පරිදි ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව ඔහු අඛණ්ඩව සේවය කළ නිලධාරියකු ලෙස සලකා ආයතන සංග්‍රහයේ **vii** පරිච්ඡේදයේ 8.1 වගන්තියට පටහැනි ලෙස සේවය නොකළ කාලය සඳහා රු. 105,402 ක සම්පූර්ණ වැටුප් හා දීමනා හා වැටුප් පියවරයන් ලබාදී තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්
---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාල විද්‍යායතනය සඳහා ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ ලැබී තිබූ රු. 367,957,867 ක් වටිනා පුහුණු උපකරණ අදාල පුහුණු විද්‍යාගාර භාර උපදේශකයන් වෙත විධිමත් පරිදි භාරදී ඉන්වෙන්ට්‍රි ලේඛන වලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) නිරන්තරයෙන් සිදුවන තාක්ෂණික වෙනස්වීම්වලට අනුගත විය හැකි පරිදි සිසුන්ගේ හා උපදේශකවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීමේ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
----------------------------------

මධ්‍යම ගමනාගමන මණ්ඩලය යටතේ පත්වීම් ලබාදී පසුව ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට අනුයුක්ත කල සේවකයන්ගේ වැටුපෙන් අයකරගෙන ඇතත් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදලට ඇතුළත් කර නොගත් සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් වලින් කොටසක් ආයතනය විසින් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. ඉහත ආයෝජනවලින් උපයාගත් පොලිය හා නිවාස ණය සඳහා වැටුපෙන් අයකර ගන්නා ලද ණය වාරික ඇතුළුව එකතුව රු. 3,420,066 ක් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මගින් නිෂ්පාදන තාක්ෂණවේදී පාඨමාලාව (Production Technology) ආරම්භ කිරීම සඳහා 2014 දෙසැම්බර් මාසයේදී රු. 240,496,777 ක් වටිනා උපකරණ ලබා දී තිබුණත් විගණන දිනය වූ 2016 සැප්තැම්බර් 07 දින වන විටත් එම පාඨමාලාව ආරම්භ කර නොතිබුණු බැවින් එම උපකරණ නිෂ්කාර්යව පැවතුනි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 268 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් දිනට ආයතනයේ සේවක පුරප්පාඩු 22 ක් පැවතුනි. මෙම පුරප්පාඩු අතර ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ඍජු බලපෑමක් ඇතිවිය හැකි, අධ්‍යක්ෂ/විදුහල්පති තනතුර වර්ෂ 03 ක්ද, ලේඛකාධිකාරී තනතුර වර්ෂ 02 මාස 08 ක්ද, පුරප්පාඩුව පැවතුනි. එමෙන්ම මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 21 ක් පුරප්පාඩුව පැවති අතර ගණකාධිකාරී, සහකාර ලේඛකාධිකාරී, පරිපාලන නිළධාරී හා සහකාර කළමණාකරු එම තනතුරු අතර විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2008 සැප්තැම්බර් 29 දිනැති DMS/C1/PS/34 අංක දරන ලිපිය මගින් ආයතනය සඳහා නව වැටුප් ව්‍යුහයක් අනුමත කර තිබුණද එම වැටුප් ව්‍යුහයන්ට අනුව සේවක අන්තර්ග්‍රහණයේදී විවිධ ගැටළු උද්ගත වී තිබුණි. විස්තර පහත සඳහන් වේ.

(i) අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව අභ්‍යන්තර විගණක II තනතුර සඳහා අභ්‍යන්තර බඳවාගැනීමකදී අවම වශයෙන් කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ පළමු ශ්‍රේණියේ (JM –1–1) වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු වුවත් කළමනාකරණ සහකාර MA – 1 – 2 ගණයේ තනතුරෙහි මාස 05 ක සේවා පළපුරුද්දක් පමණක් සපුරා තිබූ නිලධාරිනියක එම තනතුරට පත්කර තිබුණි.

(ii) ප්‍රධාන ඉංජිනේරු නිෂ්පාදන හා නඩත්තු තනතුර සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටියට අනුව අභ්‍යන්තරව බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා ගණයේ පළමු ශ්‍රේණියේ MM – 1 – 1 නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු තනතුරේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු වුවත් ඊට පටහැනිව කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ JM –1–1 හි වසර 3 ක කාලයක් සම්පූර්ණ කර තිබූ නිලධාරියකු එම තනතුරට පත්කර තිබුණි.

(iii) ජ්‍යෙෂ්ඨ අභ්‍යාස ඉංජිනේරු තනතුරට පත්වූ නිලධාරීන් 04 දෙනෙකු විශ්‍රාම ගොස් ඇතත්, උසස්වීම් නොසලකා නව වැටුප් පියවර ගණනය කිරීම නිසා විෂමතා ඉවත් නොකරන ලද වැටුප පදනම් කරගෙන පාරිතෝෂික දීමනා හා අර්ථ සාධක අරමුදල් ගෙවා තිබුණි.

(iv) ආයතනය විසින් වැටුප් ව්‍යුහයේ සංශෝධනයන් කිරීමේදී ඉංජිනේරු තනතුරුවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා උසස්වීම් නොසලකා නව වැටුප් පියවරයන් සකස් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකය විසින් පුහුණු පාඨමාලා පැවැත්වීමේ ප්‍රගතිය, ප්‍රාග්ධන වත්කම් අත්පත්කරගැනීම, පද්ධතිවල අභ්‍යන්තර පාලනය, ලේඛන නඩත්තුව ආදී ක්ෂේත්‍රයන්වල විගණන කටයුතු සිදුකර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ වාර්ෂික විගණනය සඳහා වෙන්කල හැකි සම්පූර්ණ මිනිස් පැය 3923 කින් පැය 975 ක් ආයතනයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා යොදවා තිබුණි.

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

එකතු වටිනාකම රු. 1,103,200 ක් වූ පරිගණක ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2010 හා 2011 වර්ෂවලදී රු. 591,100 ක් වැයකර තිබුණද එහි පැවති අඩුපාඩු හා දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂ/විදුහල්පතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මානව සම්පත් කළමණාකරණය | ඉහළ කළමනාකරණ මට්ටම්වල තනතුරු පුරප්පාඩු නොපිරවීම, සේවා ව්‍යවස්ථා හා අනුමත වැටුප් ව්‍යුහයන්හී පවතින ගැටළු නිරාකරණය පිළිබඳ නිසි අවධානය යොමු නොවීම. |
| (ආ) ගිණුම්කරණය | වත්කම් නිවැරදිව වාර්තා වන පරිදි විධිමත් ගිණුම්කරණ පද්ධතියක් පවත්වා නොගැනීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | **i.** වාර්තා නිසි පරිදි නඩත්තු කර අයවිය යුතු ආදායම් නියමිත කාලය තුළ අයකර නොගැනීම.<br>**ii.** පුහුණු වැඩසටහන් ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු නොවීම. |